රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 138

මගේ අංකය: 507/ළ/1127/13 ඩීසී
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ
අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.
1979 මැයි මස 02දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානයන් සහ
ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානයන් වෙත.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 120 මගින් ඉංජිනේරුවන්ට දුන් ඇතැම් අනුග්‍රහ
මධ්‍යම මට්ටමේ කාර්මික විද්‍යාඥයින් සහ පුහුණු කම්කරු ශ්‍රේණිවලට දීම.

මධ්‍යම මට්ටමේ කාර්මික විද්‍යාඥයන් සහ පුහුණු කම්කරු ශ්‍රේණිවල අය රජයේ සේවය අතහැර යාම නිසා රජයේ දෙපාර්තමේන්තුවලත්, ව්‍යවස්ථාපිත මණ්ඩලවලත් වැඩ කටයුතුවල ප්‍රගතියට බාධා පැමිණ ඇත. එහෙයින් රාජ්‍ය සේවයට නැවත පැමිණීමට ඔවුන් දිරි ගැන්වීමේ පෙළඹවීමක් වශයෙන් එකී ශ්‍රේණිවල නිලධරයන්ට පහත දැක්වෙන අනුග්‍රහයන් දීමට රජය තීරණය කර ඇත.

1. රජයේ සේවයෙන් ඉල්ලා අස්වී නැතහොත් විශ්‍රාම ගෙන යළිත් සේවයට බැඳීමට කැමැත්තෙන් සිටින මධ්‍යම මට්ටමේ කාර්මික විද්‍යාඥයන් සහ පුහුණු කම්කරු ශ්‍රේණිවල අය රජයේ සේවයෙන් පිටස්තරව ඔවුන් ලද පළපුරුද්ද සැලකිල්ලට ගනිමින් වැටුප් පරිමාණයෙහි යෝග්‍ය වැටුප් තලයක තැබිය යුතුය.

2. සේවයෙන් ඉල්ලා අස්වන, විශ්‍රාම ලබන අවස්ථාවේ දී විශ්‍රාම වැටුප් හිමි තනතුරු දරමින් සිටි අයගේ අතීත සේවය, දැනට සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ පවත්නා ජ්‍යෙෂ්ඨත්වයට හානියක් නොවන පරිදි, විශ්‍රාම වැටුප් කාර්යයන් සම්බන්ධයෙන් ගණන් ගත යුතුය.

ආයතන අධ්‍යක්ෂ.

අ.ක./ඩී.බී.අයි.පී.එස්.සිරිවර්ධන.
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ලේකම්.